# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

# THE CEYLON GOVERNMENT GAZETTE

EXTRAORDINARY

අංක 14,572 — 1965 නොවැම්බර් 29 වැනි සඳුද — 1965.11.29

No. 14,572 MONDAY, NOVEMBER 29, 1965

(Published by Authority)


# PART I: SECTION (I)—GENERAL

## Government Notifications

### LOCAL AUTHORITIES ELECTIONS

**New Election Laws**

NOTICE FOR GENERAL INFORMATION

RELEVANT extracts of certain amendments to the provisions of the Local Authorities Elections Ordinance are reproduced below for information of the General Public, Political Parties and Candidates.

E. F. DIAS ABEYESINGHE,
Commissioner of Elections (Local Bodies).

Office of the Commissioner of Elections,
33, Horton Place,
Colombo 7, November 25, 1965.

PROVISIONS REFERRED TO

*Recognised Political Parties for the Purpose of Local Elections*

27A. (1) A political party shall, under and in accordance with the provisions of this Ordinance, be entitled to be treated as a recognized political party for the purpose of local elections.

(2) A political party shall be entitled to be treated as a recognized political party for the purpose of local elections if, but only if, it was, at the last parliamentary general election immediately preceding such local elections, treated as a recognized political party under Parliamentary Elections Order in Council for the purpose of the provisions of section 29 of that Order relating to the deposit to be made by candidates.

(3) Where a political party is entitled, by virtue of the operation of the provisions of sub-section (2), to be treated as a recognized political party for the purpose of local elections, the approved symbol allotted to the candidates of such party under the Parliamentary Elections Order in Council at the last parliamentary general election immediately preceding such local elections shall be deemed to be the approved symbol allotted to such party for that purpose until the date on which it ceases to be so entitled by virtue of sub-section (2).

*Official Poll Cards*

39A. (1) The returning officer for any ward in which an election is contested shall, if that ward is a ward to which this sub-section applies, send by post to each voter whose name appears in the electoral list for that ward an official poll card specifying—

(a) the number and name (if any) of the ward,
(b) the name, address and number of the voter as stated in electoral list,
(c) the polling station allotted to the voter, and
(d) the date and hours of the poll.

(2) An official poll card under sub-section (1) shall be so sent to a voter as to reach him at least five days before the date of poll. Where a post office fails to deliver such an official poll card to the person to whom it is addressed, it shall be retained in such post office until the date of the poll and shall be delivered to the addressee if he calls for it.

(3) Every person who—

(a) without authority supplies any official poll card to any other person, or
(b) sells or offers to sell any official poll card to any other person or purchases or offers to purchase any official poll card from any other person,

shall be guilty of an offence and shall, on conviction after summary trial before a Magistrate, be liable to a fine not exceeding five hundred rupees or to imprisonment of either description for a term not exceeding six months or to both such fine and imprisonment.

(3A) Every person,—

(a) other than a public servant acting in the course of his duty as such servant, who has in his possession the official poll card of any other person; or
(b) who without due authority prints any official poll card or what purports to be or is capable of being used as an official poll card at any election under this Ordinance,

shall be guilty of an offence and shall, on conviction after summary trial before a Magistrate, be liable to a fine not exceeding five hundred rupees or to imprisonment of either description for a term not exceeding six months or to both such fine and imprisonment.

(4) The Minister may, from time to time, by Order published in the *Gazette*, declare that, with effect from such date as shall be specified in the Order, the provisions of sub-section (1) shall apply to every ward of any such electoral area or areas as shall be so specified.

*Note.*—The Minister of Local Government has made these provisions applicable in respect of every general election and by-election to Municipal Councils, Urban Councils and Town Councils with effect from 6.12.65.

*Use of Indelible Ink for the Marking of Voters*

53A. (1) No ballot paper shall be delivered to any voter at any local election—

(a) if he refuses to allow the presiding officer or a person acting under his authority to make the appropriate inspection; or
(b) if, having allowed such inspection, it discloses that such voter has already been marked with the appropriate mark; or
(c) if, having allowed such inspection, it discloses that such voter has not already been marked with the appropriate mark, but such voter refuses to allow such officer or person to mark such voter with the appropriate mark,

and accordingly such voter shall, notwithstanding anything to the contrary in any other provision of this Ordinance, not be entitled to vote at such election.

(2) The presiding officer of a polling station shall enter on a list, substantially in the form set out in the Seventh Schedule to this Ordinance, the following particulars relating to each voter to whom a ballot paper was not delivered at such station under sub-section (1):—

(a) the number of such voter in the electoral list of the ward of the electoral area in which the election is held;
(b) the name and address of such voter as it appears in such list; and

(c) the ground on which a ballot paper was not delivered to such voter.

Such list is in this Ordinance called the " list of voters to whom ballot papers are not delivered under section 53A ".

(3) In this section,—

(a) the expression " appropriate mark " means a mark made with indelible ink;

(b) the term " appropriate ", with reference to any context connected with or relating to the inspection or marking of a voter, means—

(i) the little finger of his left hand or, if such finger is missing, any other finger of his left hand; or

(ii) if, all the fingers of his left hand are missing, the little finger of his right hand, or, if such finger is missing, any other finger of his right hand; or

(iii) if all the fingers of his left and right hands are missing, such extremity of his left or right hand as such voter possesses.

(4) Every person who—

(a) without due authority places an appropriate mark on any voter at any election under this Ordinance or what purports to be or is capable of being mistaken for that mark; or

(b) fraudulently defaces any appropriate mark placed on any voter at such election without due authority,

shall be guilty of an offence and shall, on conviction after summary trial before a Magistrate, be liable to a fine not exceeding five hundred rupees or to imprisonment of either description for a term not exceeding six months or to both such fine and imprisonment.

*Personation*

80. Any person who, at any election under this Ordinance applies for a ballot paper in the name of some other person, whether that name be that of a person living or dead or of a fictitious person, or, who having voted once at such election, applies at the same election for a ballot paper in his own name, shall be guilty of the offence of personation, which shall be a cognizable offence within the meaning of the Criminal Procedure Code and shall, on conviction after summary trial before a Magistrate, be liable to rigorous imprisonment for a term not exceeding one year.

*Undue Influence*

81. Every person—

(1) who directly or indirectly, by himself or by any other person on his behalf, makes use of or threatens to make use of any force, violence, or restraint, or inflicts or threatens to inflict, by himself or by any other person, any temporal or spiritual injury, damage, harm, or loss upon or against any person in order to induce or compel such person to vote or refrain from voting at any election under this Ordinance or on account of such person having voted or refrained from voting at such election, or

(2) who by abduction, duress, or any fraudulent device or contrivance impedes or prevents the free exercise of the franchise of any voter, or thereby compels, induces, or prevails upon any voter either to give or to refrain from giving his vote at such election, or

(3) who, being a member or official of a religious order or organization,—

(a) denies or threatens to deny, to any member or adherent of that order or organization, or to any member of the family of such member or adherent, any spiritual ministration, service or benefit, to which such member or adherent would in the ordinary course have been entitled; or

(b) excludes, or threatens to exclude, such member or adherent from such order or organization,

in order to induce or compel such member or adherent to vote or refrain from voting for any candidate at such election, or to support or refrain from supporting any political party at such election, or on account of such member or adherent having voted or refrained from voting for a candidate at such election, or having supported or refrained from supporting any political party at such election, or

(4) who being the employer of any other person,—

(a) terminates or threatens to terminate such employment; or

(b) denies or threatens to deny to such other person any benefit or service which such other person already enjoyed, or would have enjoyed, in the ordinary course of such employment,

in order to induce or compel such other person to vote or refrain from voting for any candidate at such election, or to support or refrain from supporting any political party at such election, or on account of such other person having voted or refrained from voting for any candidate at such election, or having supported or refrained from supporting any political party at such election, or

(5) who, at any time during the period commencing on the day of nomination at any election and ending on the day following the date of the poll at such election,—

(a) utters at any religious assembly any words for the purpose of influencing the result of such election or inducing any voter to vote or refrain from voting for any candidate at such election, or

(b) for such purpose distributes or displays at any religious assembly any handbill, placard, poster, notice, sign, flag or banner, or

(c) holds or causes to be held a public meeting at a place of worship for the purpose of promoting the election of any candidate at such election,

shall be guilty of the offence of undue influence and shall, on conviction after summary trial before a Magistrate, be liable to a fine not exceeding five hundred rupees, or to imprisonment of either description for a term not exceeding six months or to both such fine and imprisonment.

*Canvassing, etc., within a quarter of a mile of a Polling Station*

81A. (1) No person shall, on any date on which a poll is taken at a polling station, do any of the following acts within a distance of a quarter of a mile of the entrance of that polling station:—

(a) canvassing for votes;

(b) soliciting the vote of any voter;

(c) persuading any voter not to vote for any particular candidate;

(d) persuading any voter not to vote at the election;

(e) distributing or exhibiting any handbill, placard, poster or notice relating to the election (other than any official handbill, placard, poster or notice) or any symbol allotted under section 38 to any candidate.

(2) No person shall, on any date on which a poll is taken at any polling station—

(a) use or operate, within or at the entrance of a polling station or in any public or private place in the neighbourhood thereof, any megaphone or loudspeaker or other apparatus for magnifying or reproducing the human voice; or

(b) shout or otherwise act in a disorderly manner within or at the entrance of a polling station or in any public or private place in the neighbourhood thereof,

so as to cause annoyance to any person visiting the polling station for the poll or so as to interfere with the work of the officers and other persons on duty at the polling station.

*Restriction on use of buildings on Election Day, Processions, etc.*

81A. (2A) No person—

(a) who is a candidate at any election in any electoral area shall, on the day on which the poll is taken at such election, use in that area any building or structure (whether temporary or otherwise), other than the ordinary place of residence of such candidate, for any purpose calculated to promote the election of such candidate; or

(b) shall, at any time during the period commencing on the day of nomination at any election in any electoral area and ending on the day immediately following the date on which the poll is taken at such election, conduct, hold or take part in any procession, other than a procession on May 1, in any year, or any procession for religious or social purposes; or

(c) shall, at any procession held or conducted during the period referred to in paragraph (b) of this sub-section, do any act or thing calculated to promote the election referred to in the said paragraph (b).

(3) Every person who contravenes any of the provisions of sub-section (1), sub-section (2) or sub-section (2A) shall be guilty of an offence and shall, on conviction after summary trial before a Magistrate, be liable to a fine not exceeding one hundred rupees or to imprisonment of either description for a term not exceeding one month or to both such fine and imprisonment.

(4) Any police officer may take such steps, and use such force, as may be reasonably necessary for preventing any contravention of the provisions of sub-section (2) and may seize any apparatus used for such contravention.

(5) Every person who attempts to commit an offence specified in this section shall be liable to the punishment prescribed for that offence.

(6) Every offence under this section shall be a cognizable offence within the meaning of the Criminal Procedure Code.

(7) A prosecution for an offence under this Section shall not be instituted without the sanction of the Attorney-General.

*Display of Flags, Banners, Posters, Handbills, etc.*

81B. (1) During the period commencing on the day of nomination at any election under this Ordinance and ending on the day following the day on which a poll is taken at such election, no person shall, for the purpose of promoting the election of any candidate at such election, display—

(a) in any premises, whether public or private, any flag or banner except in or on any vehicle that is used for the conveyance of a candidate at such election, or

(b) any handbill, placard, poster, notice or sign on any place to which the public have a right of, or are granted, access except in or on any premises on any day on which a meeting in support of a candidate at such election is due to be held in that premises; or

(c) any handbill, placard, poster, notice, sign, flag or banner, on or across any public road; or

(d) any handbill, placard, poster, notice or sign in or on any vehicle, except in or on any vehicle that is used for the conveyance of a candidate at such election.

(2) Every person who contravenes any of the provisions of sub-section (1) shall be guilty of an offence and shall, on conviction after summary trial before a Magistrate, be liable to a fine not exceeding one hundred rupees or to imprisonment of either description for a term not exceeding one month or to both such fine and imprisonment.

(3) Every person who attempts to commit an offence specified in this section shall be liable to the punishment prescribed for that offence.

(4) Every offence under this section shall be a cognizable offence within the meaning of the Criminal Procedure Code.

(5) Any police officer may take such steps, and use such force, as may be reasonably necessary for preventing any contravention of the provisions of sub-section (1) and may seize and remove any handbill, placard, poster, notice, sign, flag or banner used in such contravention.

*Conveyance of Voters to or from the Poll, offences and Penalties*

81C. (1) No person shall let, lend, employ, hire, borrow or use, or aid or abet any other person to let, lend, employ, hire, borrow or use, any vehicle, vessel or animal for the purpose of conveying any voter to or from the poll.

(2) Any person who contravenes any of the provisions of sub-section (1) shall be guilty of an offence and shall, on conviction after summary trial before a Magistrate, be liable to a fine not exceeding one hundred rupees, or to imprisonment of either description for a term not exceeding one month, or to both such fine and imprisonment.

(3) Notwithstanding anything in the preceding provisions of this section,—

(a) where a person is unable at any election under this Ordinance to reach his polling station from his place of residence without crossing the sea or a branch or arm thereof or a river, the use of a means of transport to enable him to reach his polling station shall be deemed not to be a contravention of the provisions of sub-section (1);

(b) the conveyance of a person at his own expense to or from the poll at any election in, or the use by any person at his own expense for the purpose of the conveyance of himself to or from the poll of, any public transport service provided by the Ceylon Transport Board, the Ceylon Government Railway, or the Colombo Municipal Council, shall be deemed not to be a contravention of the provisions of sub-section (1);

(c) where the returning officer for any electoral area is satisfied, upon written application in that behalf made to him by any person (not being a candidate) so as to reach such officer seven days before the day on which a poll is to be taken at any election in that area, that such person is unable, by reason of any physical disability, to convey himself to and from the poll on foot or in any public transport service referred to in paragraph (b) of this sub-section, the returning officer may give such person written authority to use any vehicle, vessel or animal for the purpose of conveying himself to and from the poll, and accordingly the use of a vehicle, vessel or animal for the purpose of such conveyance by such person shall be deemed not to be a contravention of the provisions of sub-section (1).

(4) Where at a poll taken at any election in any electoral area under this Ordinance, any vehicle, vessel or animal is being used in contravention of the provisions of sub-section (1), any police officer may stop and seize such vehicle, vessel or animal, and take it to a police station and detain it therein until the conclusion of the poll.

(5) A court may, on the conviction of any person for an offence under this section, make order declaring that any vehicle, vessel or animal used in or in connection with the commission of such offence shall be forfeited to Her Majesty.

*False Reports in Newspapers*

81D. (1) Where there is published in any newspaper any false statement concerning, or relating to,—

(a) the utterances or activities at any election under this Ordinance of any candidate, or any political party which is contesting such election, whether or not such party is a recognized party for the purpose of local elections; or

(b) the conduct or management of such election by such candidate, or any such party,

and such statement is capable of influencing the result of such election, then, every person who at the time of such publication was the proprietor, the manager, the editor, the publisher or other similar officer of that newspaper, or was purporting to act in such capacity, shall each be guilty of an offence unless such person proves that such publication was made without his consent or connivance, and that he exercised all such diligence to prevent such publication as he ought to have exercised having regard to the nature of his functions in such capacity and in all the circumstances.

(2) Any person who is guilty of an offence under sub-section (1) shall, on conviction after summary trial before a Magistrate, be liable to a fine not exceeding five hundred rupees, or to imprisonment of either description for a term not exceeding one month or to both such fine and imprisonment.

(3) In this section, the term "newspaper" includes any journal, magazine, pamphlet or other publication.

*Plural Voting*

82. If any person—

(a) votes more than once at any general election under this Ordinance, whether in the same electoral area or different electoral areas, or asks for a ballot paper for the purpose of so voting; or

(b) votes more than once in the same ward of an electoral area at any election under this Ordinance, or asks for a ballot paper for the purpose of so voting,

such person shall be guilty of an offence and shall, on conviction after summary trial before a Magistrate, be liable to rigorous imprisonment for a term not exceeding one year.

*Duty of Employers to Grant Leave to Enable Employees to Vote*

84A. (1) Any person, being the employer of any other person who is entitled to vote at any election under this Ordinance shall, upon application in writing in that behalf made by such other person, grant such other person, leave, without loss of pay, for such continuous period (not less than two hours in duration) as that person may deem sufficient to enable such other person to vote at that election.

(2) Any person who contravenes or fails to comply with the provisions of sub-section (1) shall be guilty of an offence and shall, on conviction after summary trial before a Magistrate, be liable to a fine not exceeding five hundred rupees, or to imprisonment of either description for a term not exceeding one month, or to both such fine and imprisonment.

*Destruction, etc., of Notices or Documents*

85A. Every person who, without lawful authority, destroys, mutilates, defaces or removes any notice which is exhibited by any authority under this Ordinance, or any document which is made available for inspection in accordance with this Ordinance, shall be guilty of an offence and shall, on conviction after summary trial before a Magistrate, be liable to a fine not exceeding fifty rupees.

11—1241

PRINTED AT THE GOVERNMENT PRESS, CEYLON, ON PAPER MANUFACTURED AT THE EASTERN PAPER MILLS CORPORATION, VALAICHCHENAI, CEYLON

(ආ) ඒ කාර්‍ය්‍යය සඳහා යම් ආගමික රැස්වීමක දී යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොලයක්, දැන්වීමක්, සලකුණක් ධජයක් හෝ පතාකයක් බෙදා හරින හෝ ප්‍රදර්ශණය කරන හෝ

(ඇ) ඒ ඡන්ද විමසීමේ දී යම් අපෙක්ෂකයකු තෝරා ගැනීමේ ඉඩ වැඩි දියුණු කිරීමේ කාර්‍ය්‍යය සඳහා පූජනීය ස්ථානයක මහජන රැස්වීමක් පවත්වන හෝ පැවැත්වීමට සලස්වන, හෝ

සෑම තැනැත්තකුම අයුතු බලපෑමේ වරදට වරදකරු විය යුතු අතර, සුළු අපරාධ විනිශ්චයකාරවරයකු ඉදිරිපිට දී පැවැත්වෙන ලඝු නඩු විසඳීමකින් පසු වරදකරුවීමේ දී රුපියල් පන්සීයයකට නොවැඩි දඩයකට හෝ හයමාසයකට නොවැඩි කාල සීමාවකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතුය.

## ඡන්ද පොලේ සිට හැතැප්ම කාලක් වූ දුරක් ඇතුලත ඡන්ද ආයාචනා කිරීම් ආදිය

81අ. (1) ඡන්දපොලක ඡන්ද විමසීමක් කරනු ලබන යම් දිනයක ඒ ඡන්ද පොලට ඇතුළුවන ස්ථානයේ සිට සැතපුම් කාලක් වූ දුරක් ඇතුලත කිසිම තැනැත්තකු විසින් පහත දැක්වෙන ක්‍රියාවලින් යමක් නො කළ යුතුය :—

(අ) ඡන්ද ආයාචනය කිරීම ;

(ආ) යම් ඡන්දදායකයකුගේ ඡන්දය ඉල්ලීම ;

(ඇ) යම් නිශ්චිත අපෙක්ෂකයකුට ඡන්දය නොදෙන ලෙස යම් ඡන්දදායකයකු කැමති කරවා ගැනීම ;

(ඈ) ඡන්දය විමසීමේ දී ඡන්දය නොදෙන ලෙස ට යම් ඡන්ද දායකයකු කැමති කරවා ගැනීම ;

(ඉ) ඡන්ද විමසීමට සම්බන්ධ යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශණ පත්‍රයක්, දැන්වීම් කොලයක් හෝ දැන්වීමක් (යම් කාර්‍ය්‍යාලීය අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශණ පත්‍රයක්, දැන්වීම් කොලයක් හෝ දැන්වීමක් හැර) හෝ 38 වන වගන්තිය යටතේ යම් අපෙක්ෂකයකු හට වෙන් කර දෙන ලද යම් ලකුණක් හෝ බෙදා හැරීම හෝ ප්‍රදර්ශණය කිරීම ;

(2) යම් ඡන්ද පොලක ඡන්දයක් විමසනු ලබන යම් දිනයක කිසිම තැනැත්තකු විසින්—

(අ) ඡන්ද පොලක් ඇතුලත හෝ ඡන්ද පොලකට ඇතුලුවන දොරටුව ලඟ හෝ ඡන්ද පොල අසල වූ යම් මහජන ස්ථානයක් හෝ පෞද්ගලික ස්ථානයක දී යම් මෙගපෝනයක් හෝ ශබ්ද විකාශන යන්ත්‍රයක් හෝ මිනිස් කටහඬ විස්තාරණය කිරීම හෝ ප්‍රත්‍යුත්පාදනය කිරීම සඳහා වූ වෙනත් උපකරණයක් පාවිච්චි කිරීම හෝ ක්‍රියාත්මක කිරීම, හෝ

(ආ) ඡන්දය විමසීම සඳහා ඡන්ද පොලට පැමිණෙන යම් තැනැත්තකුට කරදරයක් වන සේ නැතහොත් ඡන්ද පොලෙහි සේවයේ යෙදී සිටින නිලධරයන්ගේ සහ වෙනත් තැනැත්තන්ගේ වැඩට බාධා ඇතිවන සේ ඡන්ද පොලක් ඇතුලත හෝ ඡන්ද පොලකට ඇතුළු වන දොරටුව ලඟ හෝ ඡන්ද පොල අසල වූ යම් මහජන ස්ථානයක දී හෝ පෞද්ගලික ස්ථානයක දී, කෑ ගැසීම හෝ අනිසි ලෙස වෙනත් අන්දමින් ක්‍රියා කිරීම හෝ නොකළ යුතුය.

## ඡන්දය විමසන දින ගොඩනැගිලි පාවිච්චි කිරීම සහ පෙරහැරවල් පැවැත්වීම ආදිය තහනම් කිරීම

81අ (2අ). යම් ඡන්ද ප්‍රදේශයක යම්කිසි ඡන්ද විමසීමක අපෙක්ෂකයකු වන්නා වූ කිසිම තැනැත්තකු විසින්—

(අ) ඒ ඡන්ද විමසීම් ඡන්ද විමසන දිනයෙහි ඒ කොට්ඨාශය තුල ඒ අපෙක්ෂකයාගේ සාමාන්‍ය වාසස්ථානය හැර වෙනත් තාවකාලික හෝ නො එසේ වූ යම් ගොඩනැගිල්ලක් හෝ ඉදි කිරීමක් ඒ ඒ අපෙක්ෂකයා තෝරා ගැනීමේ ඉඩ වැඩි දියුණු කිරීමක් වශයෙන් ගණන් ගැනෙන යම් කාර්යයක් සඳහා පාවිච්චි නො කළ යුතුය ; නැතහොත්

(ආ) කිසිම තැනැත්තෙකු විසින්—යම් ඡන්ද විමසීමක දී නාම යෝජනා පත්‍ර භාර ගන්නා දිනයෙහි ආරම්භ වන හා ඒ ඡන්ද විමසීම සම්බන්ධයෙන් ඡන්ද විමසීමේ දිනයට ඉක්බිති දිනයෙන් අවසාන වන කාල සීමාව ඇතුලත යම් වර්ෂයක මැයි 1 වැනි දින පෙරහැරක් හෝ ආගමික හෝ සාමාජික කාර්යයන් සඳහා වූ යම් පෙරහැරක් හැර වෙනත් යම් පෙරහැරක් පවත්වා ගෙන යෑම, පැවැත්වීම, හෝ එයට සහභාගිවීම නොකළ යුතුය ; නැතහොත්

(ඇ) මේ උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කාල සීමාව ඇතුලත පවත්වනු ලබන හෝ පවත්වාගෙන යනු ලබන යම් පෙරහැරක දී එකී (අ) ඡේදයේ සඳහන් ඡන්ද විමසීමෙන් තෝරා ගැනීමේ ඉඩ වැඩි දියුණු කිරීමක් වශයෙන් ගණන් ගැනෙන යම් ක්‍රියාවක්, හෝ දෙයක් නොකළ යුතුය.

(3) (1) වැනි උප වගන්තියේ (2) වැනි උප වගන්තියේ හෝ (2අ) වැනි උප වගන්තියේ විධිවිධානවලින් කිසිවක් කඩ කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර සුළු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරිපිට දී පැවැත්වෙන ලඝු නඩු විසඳීමකින් පසු වරදකරු වීමේ දී රුපියල් සියයකට නොවැඩි දඩයකට හෝ එක් මසකට නොවැඩි කාල සීමාවකට යන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දෙකටම යටත් විය යුතුය.

(4) (2) වැනි උප වගන්තියේ විධිවිධාන සම්බන්ධයෙන් යම් උල්ලංඝනය කිරීමක් වැලැක්වීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි ක්‍රියා පිළිවෙලක් හා බල පෑමක් යම් පොලිස් නිලධරයකු විසින් යෙදිය හැකි අතර ඒ උල්ලංඝනය කිරීම සඳහා පාවිච්චි කරන ලද යම් උපකරණයක් තහනමට ගැනීම ද කළ හැකිය.

(5) මේ වගන්තියෙහි නිශ්චය කොට දක්වන ලද වරදක් කිරීමට තැත් කරන සෑම තැනැත්තකුම ඒ වරදට නියමිත දඬුවමට යටත් විය යුතුය.

(6) මේ වගන්තිය යටතේ වූ සෑම වරදක් ම අපරාධ නඩු විධාන සංග්‍රහයේ අර්ථය ඇතුලත සංඥෙය වරදක් විය යුතුය.

(7) මේ වගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් වූ පැමිණිල්ලක් නීතිපතිගේ අනුමතිය නොමැතිව ඉදිරිපත් නොකළ යුතුය.

## ධජ, පතාක, පෝස්ටර් දැන්වීම් සහ අත් දැන්වීම් ආදිය ප්‍රදර්ශණය කිරීම

81 ආ (1) මෙම ආඥාපනත යටතේ යම් ඡන්ද විමසීමක දී නාමයෝජනා පත්‍ර භාර ගන්නා දිනයෙන් ආරම්භ වන හා ඒ ඡන්ද විමසීම සම්බන්ධයෙන් ඡන්ද විමසීමේ දිනයට ඉක්බිති දිනයෙන් අවසාන වන කාල සීමාව තුල ඒ ඡන්ද විමසීමේ දී යම් අපෙක්ෂකයකු තෝරා ගැනීමේ ඉඩ වැඩි දියුණු කිරීමේ කාර්‍ය්‍යය සඳහා කිසිම තැනැත්තකු විසින්—

(අ) ඒ ඡන්ද විමසීමේ දී එකී අපෙක්ෂකයකු ගෙන යෑම සඳහා පාවිච්චි කරනු ලබන යම් වාහනයක් තුල හෝ මත හැර පොදු හෝ පෞද්ගලික කිසිම ස්ථානයක යම් ධජයක් හෝ පතාකයක් ; හෝ

(ආ) ඒ ඡන්ද විමසීමෙහි දී එහි අපෙක්ෂකයකුට ආධාර වශයෙන් යම් ස්ථානයක රැස්වීමක් පැවැත්වීමට ඇති යම් දිනයක ඒ ස්ථානය තුල හෝ ඒ ස්ථානයෙහි හැර මහ ජනයාට යාමට අයිතියක් ඇති හෝ ඉඩදී ඇති යම් ස්ථානයක යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, පෝස්ටර් දැන්වීමක්, දැන්වීමක් හෝ ලකුණක් ; හෝ

(ඇ) යම් මහා මාර්ගයක් මත හෝ හරහා යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, පෝස්ටර් දැන්වීමක්, දැන්වීමක්, ලකුණක්, ධජයක් හෝ පතාකයක් ; හෝ

(ඈ) ඒ ඡන්ද විමසීමේ දී එහි අපෙක්ෂකයකු ගෙන යෑම සඳහා පාවිච්චි කරනු ලබන යම් වාහනයක් තුල හෝ මත හැර වෙන යම් වාහනයක් තුල හෝ මත යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, පෝස්ටර් දැන්වීමක්, දැන්වීමක් හෝ ලකුණක් හෝ,

ප්‍රදර්ශණය නො කළ යුතුය.

(2) මෙම (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර සුළු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විසඳීමකින් පසු වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් සියයකට වැඩි නොවූ දඩයකට හෝ මාසයකට වැඩි නොවූ කාල සීමාවකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දෙකට ම යටත් විය යුතුය.

(3) මේ වගන්තියෙහි නිශ්චය කොට දක්වන වරදක් කිරීමට තැත් කරන සෑම තැනැත්තකුම ඒ වරදට නියමිත දඬුවමට යටත් විය යුතුය.

(4) මේ වගන්තිය යටතේ වූ සෑම වරදක් ම අපරාධ නඩු විධාන සංග්‍රහයේ අර්ථය ඇතුලත සඥෙය වරදක් විය යුතුය.

(5) මෙහි (1) වන උප වගන්තියේ විධිවිධානවල යම් උල්ලංඝනය කිරීමක් වැලැක්වීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි ක්‍රියා පිළිවෙලක් හා බලපෑමක් යම් පොලිස් නිලධරයකු විසින් යෙදීම කළ හැකිය. එසේම ඒ උල්ලංඝනය කිරීම සඳහා පාවිච්චි කරන ලද යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, පෝස්ටර් දැන්වීමක්, දැන්වීමක්, ලකුණක්, ධජයක් හෝ පතාකයක් තහනමට ගැනීම හා ඉවත් කිරීම කළ හැකිය.

## ඡන්ද විමසීමකට හෝ ඡන්ද විමසීම සිට ඡන්දදායකයන් එහා මෙහා ගෙන යාම—වරදවල් සහ දඬුවම්

81ඇ. කිසිම තැනැත්තකු විසින්—

(1) ඡන්ද විමසීමට හෝ ඡන්දය විමසීමෙහි සිට යම් ඡන්ද දායකයෙක් ගෙන යාමේ කාර්‍ය්‍යය සඳහා යම්කිසි වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු කුලියට දීම, අතමාරුවට දීම, සේවයෙහි යෙදීම, කුලියට ගැනීම, අතමාරුවට ගැනීම හෝ පාවිච්චි කිරීම හෝ කුලියට දීමට, අතමාරුවට දීමට, සේවයෙහි

යෙදීමට, කුලියට ගැනීමට අතමාරුවට ගැනීමට හෝ පාවිච්චි කිරීමට වෙන යම් තැනැත්තකුට ආධාර දීම හෝ අනුබල දීම නො කළ යුතුය.

(2) මෙම (1) වන උප වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන ඕනෑම තැනැත්තෙක් වරදකට වරදකරු විය යුතු අතර සුළු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරිපිට දී පැවැත්වෙන ලඝු නඩු විසඳීමකින් පසු වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් සියයකට වැඩි නොවූ දඩයකට හෝ මාසයකට වැඩි නොවූ කාල සීමාවකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතුය.

(3) මේ වගන්තියේ ඉහත දැක්වුනු විධිවිධානවල කුමක් සඳහන් වුවද—

(අ) මෙම ආඥාපනත යටතේ වූ යම්කිසි ඡන්ද විමසීමක දී ඡන්දදායකයකු පදිංචි ස්ථානයක සිට මුහුද හෝ මුහුදෙහි ශාඛාවක් හෝ මුහුදු කඩිත්තක් නැත හොත් ගංගාවක් හරහා නො ගොස් තම ඡන්ද පොල කරා එළඹිය නො හැකි වූ අවස්ථාවක, ඒ ඡන්ද දායකයාගේ ඡන්දපොලවලට ලඟා වීමට හැකිවනු පිණිස ප්‍රවාහන උපක්‍රමයක් පාවිච්චි කළ හැකි අතර එය මෙම 1 වැනි උප වගන්තියේ ප්‍රතිපාදනයන් උල්ලංඝනය කිරීමක් සේ නොසැලකිය යුතුය.

(ආ) ලංකා ගමනාගමන මණ්ඩලය හෝ ලංකා දුම්රිය සේවය හෝ කොළඹ මහ නගර සභාව මගින් සැපයෙන යම් මහජන ප්‍රවාහන සේවයකින් යම් ඡන්ද විමසීමක දී යම් තැනැත්තකු තමාගේ වියදමින් ඡන්ද විමසීමට හෝ ඡන්ද විමසීමෙන් යෑම හෝ ඡන්දපොලට හෝ ඡන්ද පොලෙන් තමා ගෙන යාමේ කායර්ය සඳහා යම් තැනැත්තකු විසින් තමාගේ වියදමින් එබඳු සේවයක් පාවිච්චි කිරීම මෙහි (1) වැනි වගන්තියෙහි ප්‍රතිපාදනයන් උල්ලංඝනය කිරීමක් නොවන ලෙස සැලකිය යුතුය.

(ඇ) යම් ඡන්ද කොට්ඨාශයක් සඳහා වූ තේරීම්භාර නිලධරයකු, ඒ ප්‍රදේශයේ යම් ඡන්ද විමසීමක දී ඡන්ද විමසීම සිදු කිරීමට ඇති දිනයට දින සතකට පෙර ඔහුට ලැබෙන පරිදි යම් තැනැත්තකු විසින් හෝ ඒ තැනැත්තා වෙනුවෙන් (අපේක්ෂකයකු නොවන) වෙන යම් තැනැත්තකු විසින් ඒ සඳහා ලිඛිත ඉල්ලීමක් කරනු ලැබූ විට, යම් ශාරීරික දුර්වලකමක් නිසා ඡන්ද විමසීමට හෝ ඡන්ද විමසීමේ සිට පයින් හෝ මේ උප වගන්තියෙහි (ආ) ඡේදයෙහි සඳහන් යම් මහජන ප්‍රවාහන සේවයකින් යාමට ඒ තැනැත්තාට නොහැකි යයි සෑහීමට පත්වූ අවස්ථාවක ඡන්ද විමසීමට හෝ ඡන්ද විමසීමේ සිට යාමේ කාර්යය සඳහා යම් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු පාවිච්චි කිරීමට ලිඛිත බලයක් ඒ තේරීම්භාර නිලධරයා විසින් ඒ තැනැත්තාට දිය හැකි අතර ඒ අනුව එසේ තමා ගෙන යාමේ කාර්යය සඳහා ඒ තැනැත්තා විසින් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු පාවිච්චි කිරීම මේ (1) වැනි උප වගන්තියේ ප්‍රතිපාදනයන් උල්ලංඝනය කිරීමක් නොවන ලෙස සැලකිය යුතුය.

(4) මෙම ආඥාපනත යටතේ යම්කිසි ඡන්ද ප්‍රදේශයක යම් ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් පැවැත්වෙන යම් ඡන්දය විමසීමක දී (1) වන උප වගන්තියෙහි විධිවිධාන උල්ලංඝනය කෙරෙමින් යම් වාහනයක්, ජල යාත්‍රාවක්, හෝ සතකු පාවිච්චි කරනු ලබමින් පවතින අවස්ථාවක යම් පොලිස් නිලධරයකු විසින් ඒ වාහනය, ජල යාත්‍රාව හෝ සතා නවත්වා, තහනමට ගෙන පොලිස් ස්ථානයට රැගෙන ගොස් ඡන්ද විමසීම අවසාන වන තුරු එහි රඳවා ගත හැකිය.

(5) මේ වගන්තිය යටතේ නීති විරෝධී ක්‍රියාවක් කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ විට, අධිකරණයක් විසින් එම වරද කිරීමෙහි ලා හෝ ඒ සම්බන්ධයෙන් පාවිච්චි කරන ලද යම් වාහනයක්, ජල යාත්‍රාවක් හෝ සතකු මහා රාජිණියන් වහන්සේ වෙත රාජසන්තක කළ යුතු යයි ප්‍රකාශ කරමින් ආඥාවක් කළ හැකිය.

## ප්‍රවෘත්ති පත්‍රවල අසත්‍ය වාර්තා

81ඇ. (1) යම් ප්‍රවෘත්ති පත්‍රයක—

(අ) මෙම ආඥාපනත යටතේ වූ යම් ඡන්ද විමසීමක දී යම් අපේක්ෂකයකුගේ හෝ ප්‍රාදේශීය ඡන්ද විමසීම්වල කායර්ය සඳහා පිළිගනු ලැබුවා වූ හෝ නොලැබුවා වූ හෝ යම්කිසි දේශපාලන පක්ෂයක්, එම ඡන්ද විමසීම සඳහා තරඟ කරන්නේ නම්, එබඳු දේශපාලන පක්ෂයක් පිළිබඳ ව හෝ

(ආ) ඒ අපේක්ෂකයා හෝ එබඳු යම් පක්ෂයක් විසින් ඒ ඡන්ද විමසීම පවත්වාගෙන යාම හෝ එහි කටයුතු කිරීම සම්බන්ධයෙන් හෝ පිළිබඳව,

යම් අසත්‍ය ප්‍රකාශයක් පළ කරනු ලැබූ සහ ඒ ප්‍රකාශය ඒ ඡන්ද විමසීමෙහි ප්‍රතිඵල කෙරෙහි බලපෑ හැකිවන අවස්ථාවක දී, එසේ එය පල කරනු ලැබූ කාලයෙහි ඒ ප්‍රවෘත්ති පත්‍රයෙහි අයිතිකරු, කළමනාකරු, සංස්කාරක, ප්‍රකාශක හෝ වෙනත් එවැනි නිලධර යෙකුව සිටි හෝ ඒ තනතුරෙහි ක්‍රියා කරන ලදැයි සැලකෙන සෑම එක් එක් තැනැත්තකු, ඒ පල කිරීම කරන ලද්දේ තමාගේ අනුමතිය හෝ අනු දැනුම නොමැතිව බව සහ ඒ තනතුරෙහි තමාට අයත් කාර්යයන්ගේ ස්වභාවය ගැන සැලකිලිමත් ව තමා විසින් යෙදිය යුතුව තිබුණු සියලු උද්‍යෝගය ඒ පල කිරීම වැලැක්වීමට සියලුම අවස්ථාවන්හි දී තමා විසින් යොදන ලද බව ඒ තැනැත්තා විසින් ඔප්පු කළ යුතුය.

(2) මෙම (1) වන උප වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන සෑම තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර සුළු අපරාධ විනිශ්චයකාරයෙකු ඉදිරියේ දී පැවැත්වෙන ලඝු නඩු විසඳීමකින් පසු වරදකරු කරනු ලැබූ කල්හි රුපියල් පන්සියයකට වැඩි නොවූ දඩයකට හෝ මාසයකට වැඩි නොවූ කාල සීමාවකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතුය.

(3) මේ වගන්තියෙහි "ප්‍රවෘත්ති පත්‍රය" යන යෙදුමට යම් සංග්‍රහයක්, සඟරාවක්, පත්‍රිකාවක් හෝ සෙසු ප්‍රකාශනයක් ඇතුළත් වේ.

## බහු ඡන්ද දීම

82. යම් තැනැත්තෙක්—

(අ) මෙම ආඥාපනත යටතේ වූ යම් මහා ඡන්ද විමසීමක දී එම ඡන්ද ප්‍රදේශයේදීම හෝ වෙනත් ඡන්ද ප්‍රදේශවල දී හෝ එක් වරකට වඩා වැඩි වාර ගණනක් ඡන්දය දෙන්නේ නම්, නැතහොත් ඡන්දය දීමේ කායර්ය සඳහා ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටින්නේ නම් හෝ,

(ආ) මෙම ආඥාපනත යටතේ යම් ඡන්ද විමසීමක දී, ඡන්ද ප්‍රදේශයක එකම කොට්ඨාශයේ දී එක් වරකට වඩා වැඩි ගණනක් ඡන්දය දෙන්නේ නම් හෝ එසේ ඡන්දය දීමේ කායර්ය සඳහා ඡන්ද පත්‍රිකාවක් ඉල්ලා සිටින්නේ නම් හෝ,

එම තැනැත්තා වරදකට වරදකරු විය යුතු අතර, සුළු අපරාධ විනිශ්චයකාරවරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විසඳීමකින් පසුව වරදකරු වූ විට එක් අවුරුද්දකට වැඩි නොවූ කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාර ගත කිරීමට යටත් වන්නේ ය.

## සේවකයන්ට ඡන්දය දීම හැකිවනු පිණිස සේවා යෝජකයා විසින් නිවාඩු දීමේ යුතුකම

84අ. (1) මෙම ආඥාපනත යටතේ යම් ඡන්ද විමසීමක දී ඡන්දය දීමට හිමිකම් ඇති අන් කිසි තැනැත්තකුගේ සේවා යෝජකයකු වූ යම් තැනැත්තකු විසින් ඒ අන් තැනැත්තා ඒ සඳහා ලියවිල්ලෙන් වූ ඉල්ලීමක් කරනු ලැබූ විට ඒ ඡන්ද විමසීමෙහි දී ඡන්දය දීමට හැකිවීම පිණිස ප්‍රමාණවත් යැයි ඒ තැනැත්තා විසින් සලකනු ලබන (පැ දෙකකට නොඅඩු කාලයක අඛණ්ඩ කාල සීමාවක්) සඳහා ඒ අන් තැනැත්තාට පඩි නැති නොවන නිවාඩු දිය යුතුය.

(2) (1) වන උප වගන්තියෙහි විධිවිධාන උල්ලංඝනය කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර සුළු අපරාධ විනිශ්චයකරුවකු ඉදිරිපිට දී පැවැත්වෙන ලඝු නඩු විසඳීමකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට හෝ මසකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම හෝ යන දෙකටම යටත් විය යුතුය.

## දැන්වීම් හෝ ලියවිලි විනාශ කිරීම ආදිය

85අ. මෙම ආඥාපනත යටතේ යම් බලධරයකු විසින් ප්‍රදර්ශණය කරන ලද යම් දැන්වීමක් හෝ මෙම ආඥාපනත යටතේ ප්‍රදර්ශණ කරනු ලැබීම පිණිස තබා ඇති යම් ලියවිල්ලක්, නීතියානුකූල බල යක් නොමැතිව විනාශ කරන, විරූප කරන, මකා දමන හෝ ඉවත් කරන සෑම කෙනෙක් ම වරදකට වරදකරු විය යුතු වන අතර, සුළු අපරාධ විනිශ්චයකාරවරයකු ඉදිරිපිට දී පැවැත්වෙන ලඝු නඩු විසඳීමකින් පසුව වරදකරු වූ විට රුපියල් පණහකට වැඩි නොවූ දඩයකට යටත් විය යුතුය.

11-1241

ලංකාවේ වැලිවේරියෙහි පිහිටි "රිස්වර්ත් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි.